ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
இலங்கை சட்ட உதவி ஆணைக்குழு
Legal Aid Commission of Sri Lanka

# ඇප සම්බන්ධ නීතිය



USAID/CORE ව්‍යාපෘතියේ ආධාර මත සකසන ලදී

USAID
FROM THE AMERICAN PEOPLE

## වගකීමෙන් මිදීමේ ප්‍රකාශය

"අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයේ (USAID) හරහා ලැබෙන ඇමරිකානු ජනතාවගේ පරිත්‍යාගශීලිත්වය මත මෙම ප්‍රකාශනය එළි දැක්වේ. මෙම වාර්තාවේ අන්තර්ගතය පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව සතුවන අතර එමඟින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයෙහි (USAID) හෝ ඇමෙරිකානු එක්සත් ජනපද රජයේ මතය කිසිඳු අයුරකින් පිළිබිඹු නොවන බව සැලකුව මැනව."

Ministry of Justice

# ඇප සම්බන්ධ නීතිය

## ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

සම්පාදනය
නීතිඥ තුෂාරි සකුන්තලා කරුණාසිංහ, LLB

copyrights@ Legal Aid Commission of Sri Lanka



# සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27)දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. වරප්‍රසාද නොලත් ප්‍රජාවන්ට නොමිලේ නීතිමය උපදෙස් ලබාදෙන අරමුණින් ව්‍යාවස්ථාපිත නීති ආයතනයක් ලෙස කොමිසම මානව හිමිකම්, ළමා අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, වැඩිහිටි අයිතිවාසිකම්, පවුල් නීතිය, කම්කරු නීතිය, වැනි ක්ෂේත්‍ර කිහිපයක නීතිමය සහය ලබාදෙයි. හැකිතාක් සිවිල් නීතියේ සහන සැලසීමට, දැනුවත් කිරීමට සහ මඟපෙන්වීම සඳහා අපගේ ආධාර පුළුල් කර ඇත්තෙමු.

අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන බොහෝ සංවිධාන තිබුනත්, ශ්‍රී ලංකා රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නීතිමය කටයුතු කරගෙන යාමට නීතිමය බලය ඇති එකම ආයතනය නීති ආධාර කොමිෂන් සභාවයි.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව ආදායම, සමාජ තත්වය, ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වයස නොසලකා උපදෙස් ලබා දෙයි. පීඩිත සහ අවදානමට ලක්ව ඇති දිවයින පුරා විසිරී සිටින දහස් ගනනකට නීතියේ පිහිට සමානව ලබාදීම ගැන අප ආඩම්බර වෙමු.

මෙම පොත් එකතුව ප්‍රජාවන්ට, නිලධාරින්ට සහ පුද්ගලයන්ට නීතිය අවබෝධ කර ගැනීමටත්, ඔවුන් ගේ අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව දැනුවත් වීමටත් අත්වැලක් වේ. තව දුරටත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ නිලධාරීන් මඟින් අවශ්‍ය නීතිමය සහය සහ උපදෙස් ලබා ගත හැකි බව දැනුවත් වීමට මෙය උපකාර වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

**ජනාධිපති නීතිඥ රොහාන් සහබන්දු**

සභාපති, ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

# ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27) දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. එමඟින් අවදානමට ලක් විය හැකි, අඟහිඟකම් ඇති ප්‍රජාවන්ට, සමාජ තත්වයෙන් හෝ ආර්ථික තත්වයෙන් හෝ ස්ත්‍රී පුරුෂ භාවය අනුව යුක්තිය සඳහා ප්‍රවේශ වීම සීමා වී ඇති පුද්ගලයින්ට නීති ආධාර සැපයීම උදෙසා පිහිටුවන ලද්දකි.

තිරසාරභාවය හා ස්ථාවරත්වය උදෙසා නීතිමය ආධාර සපයන වෙනත් ආයතන හා සංවිධාන අතරින් මෙම කොමිසන් සභාව ප්‍රමුඛස්ථානයක් ගනී.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව දිවයින පුරා පළාත් 9 ක මධ්‍යස්ථාන 84 පවත්වා ගෙනයන අතර දැනුවත් කිරීම සහ ආදයම් සීමාවකින් තොරව සියලුම දෙනාට නීති උපදෙස් සම්පාදන ලබා දීම පිළිබඳව අවබෝධ කිරීම් සිදුකරයි. එහි ස්ථිර නීතිඥයින් 120ට අධික සංඛ්‍යාවක් සහ නිදහස් වෘත්තීක නීතිඥයන් 1000 ට අධික සංඛ්‍යාවක් කාර්යයේ නිරත වේ.

''කොමිෂන් සභාවේ දැක්ම වන්නේ සියලුම ශ්‍රී ලාංකිකයන්ට යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් තිබිය යුතු සමාජයක් නිර්මාණය කිරීමයි.'' මෙම අරමුණ සාක්ෂාත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව බොහෝ ව්‍යාපෘති සිදුකර ඇත.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ මෙහෙවර වන්නේ රටේ නීතිමය පිහිට ලැබිය යුතු පුද්ගලයන්ට පිහිට ආධාර ලබාදීම බව පනතේ සඳහන් වේ.


# අපගේ දැක්ම

### යුක්තියට සම ප්‍රවේශයක්

ශ්‍රී ලාංකිකයින්ට ඔවුන්ගේ ආර්ථික හෝ සමාජ තත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, කුලය, ආගම හෝ ජාතිකත්වය හෝ ආබාධිතභාවය නොසලකා යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් ඇති සමාජයක් නිර්මාණය කිරීමයි.

# පටුන


| | පිටු අංක |
|---|---|
| ඇප සම්බන් නීතිය යනු කුමක් ද? | 01 |
| සීමාව අභිබවා සැකකරුවෙකු රඳවා තබා ගත හැකි අවස්ථාද ඇත | 02 |
| ශ්‍රී ලංකාවේ ඇප සම්බන්ධ වැදගත් පනත් | 02 |
| ඇප ලබාගත හැක්කේ කවර අවස්ථාවලදී ද? | 02 |
| චුදිතගේ සහ ඇපකරුවන්ගේ ඇප කොන්දේසි (වගන්ති 405 + 406) | 03 |
| ඇප වර්ග කිහිපයක් | 04 |
| ඇප ලබා නොදෙන අවස්ථා | 05 |
| ඇප දීම ප්‍රතික්ෂේප කල හැකි අවස්ථා | 07 |
| පොදු දේපල ආරක්ෂා කිරීමේ පනත | 11 |
| බන්ධාගාරයේ නිත්‍ය නියෝග | 14 |
| නීති ආධාර කොමිෂන් සභාව | 15 |
| LAC මධ්‍යස්ථාන පිහිටි ස්ථාන | 16 |



## ඇප සම්බන් නීතිය යනු කුමක් ද ?

අප නීතියේ "ඇප" යන්න විවිධ ලෙස අර්ථ නිරූපනය කර ඇත. "යම් පුද්ගලයෙකු විසින් සැකකරුවෙකු නියමිත දිනට අධිකරණය ඉදිරියේ පෙනී සිටිමට සලස්වන බවට වගබලා ගැනිම" ඇපයක් ලෙස හැඳින්විය හැක" තවද නඩු විභාගයට පෙනී සිටිම සඳහා යම් පුද්ගලයෙකු තාවකාලිකව අත්අඩංගුවෙන් නිදහස් කිරිමද අපට ඇපයක් ලෙස නිර්වචනය කල හැක.

“ශ්‍රී ලංකාවේ අපරාධමය වරදකට අත්අඩංගුවට පත්වන පුද්ගලයෙකු පැය 24 කට වැඩි කාලයක් අධිකරණය හමුවට ඉදිරිපත් නොකර අත්අඩංගුවේ තබාගත නොහැකි වේ.”

## සීමාව අභිබවා සැකකරුවෙකු රඳවා තබා ගත හැකි අවස්ථාද ඇත

- 2005 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ (විශේෂ විධිවිධාන) පනතට අනුව සැකකරුවෙකු රඳවා ගැනීමේ උපරිම කාලය පැය 48ක් වේ.

- 1978 අංක 48 දරණ ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතට අනුව පැය 72ක් දක්වා සැකකරුවෙකු රඳවා තබා ගත හැක.

## ශ්‍රී ලංකාවේ ඇප සම්බන්ධ වැදගත් පනත්

1. 1997අංක 30 දරණ ඇප පනත

2. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය


අපරාධ නඩු විධාන සංග්‍රහයේ 402ක් වැනි වගන්තියට අනුව ඇප දිය හැකි වැරිදි සම්බන්ධයෙන් "ඇප දිය යුතුය" යන්න කියවේ.

## ඇප ලබාගත හැක්කේ කවර අවස්ථාවලදී ද ?

සැකකරුවෙකුට අධිකරණය මඟින් ලබාදෙන්නා වූ ඇපය අධික නොවිය යුතු බව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 404වන වගන්තියේ දක්වා ඇත. එසේම, මෙම වගන්තියෙන් අභියාචනාධිකරණය සතු වන්නාවූ බලතල පිළිබඳව ද සඳහන් වේ.

1. එමෙන්ම, මහාධිකරණ විනිශ්චයකාරවරයෙකුට, මහේස්ත්‍රාත්වරයෙකුට ඇප මත මුදාහල අයෙකු නැවත අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් භාරයේ තබන ලෙස එවැනි අවස්ථාවක අභියාචනාධිකරණයට විධාන කල හැකි බව,

2. මහාධිකරණය විසින් හෝ මහේස්ත්‍රාත් අධිකරණය විසින් දෙන ලද ඇපය නුසුදුසු යැයි හැගෙන්නේ නම් එය වැඩි කිරීමට හෝ අඩු කිරීමට හැකි බව,




## චූදිතයාගේ සහ ඇපකරුවන්ගේ ඇප කොන්දේසි (වගන්ති 405 + 406)

ඇපලත් තැනැත්තා නඩුවට අවශ්‍ය වන සැමවිටම අධිකරණයේ පෙනී සිටිය යුතුය.

යම් සැකකරුවෙකු වෙනුවෙන් ඇප බැඳුම්කරයක අත්සන් කරන ලද පුද්ගලයෙකුට විශාල වගකීමක් පැවරෙන අතර ඔවුන් ගැටලුකාරී තත්ත්වයකට මුහුණ පාන අවස්ථාවන්ද ඇත.

අධිකරණයට මෙම ඇපකරුවන් අදාල චූදිතයා අවශ්‍ය වන සැමවිටම අධිකරණයට ඉදිරිපත් කිරීමට වගබලාගත යුතු වේ. නමුත් තමා ඇප වූ චූදිතයා කෙරෙහි තමාට විශ්වාසයක් නොවන්නේ නම් තමා එම බැඳුම්කරයෙන් නිදහස් කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටිය හැක. (408 (1)) වගන්තිය) එවැනි විටකදී, චූදිතයාව අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස දක්වා වරෙන්තුවක් නිකුත් කල හැකි බව (408 (2) වගන්තිය) දක්වා ඇත. එවැනි විටකදී ඉල්ලීම කල ඇපකරුවන් මුදා හැර වෙනත් අයෙකු ඇපකරුවෙකු ලෙස ඉදිරිපත් කල හැකිය.

# ඇප වර්ග කිහිපයක්

## මුදල් ඇප

බැඳුම්කරයේ සඳහන් මුදල අධිකරණයේ තැන්පත් කර ඇපවීම.

## සහතික ඇප

ඇපයේ වටිනාකමට දේපල ඔප්පුවක් ඇපයට තැබීම.

## පෞද්ගලික ඇප

එම සැකකරු විසින්ම බැඳුම්කරයකට අත්සන් කිරීම වේ. මෙහිදී මුදල් හෝ සහතික ඇප ඉදිරිපත් කිරීමක් සිදු නොවේ.

## ශරීර ඇප

යම් සැකකරුවෙකුට වෙනත් අයෙකු ඇපවීම මෙසේ හැඳින්වේ. මෙය යම් වටිනාකමක් ගනී. මෙහිදී ඇප කොන්දේසිය කඩකරන්නේ නම් ඇප වූ මුදල අධිකරණයට ගෙවීමට ඇපකරුවෝ බැඳී සිටිති.

## පොලිස් ඇප

ඇප දිය හැකි වරදක් සිදුකල අයෙකුට සැකපිට අත්අඩංගුවට ගත් විට පොලිස් ස්ථානය භාර නිළධාරියාට හෝ පරීක්ෂකට යම් අවස්ථාවලදී ඔහුව ඇප මත මුදා හැරීමක් සිදු කළ හැකි වේ.

### අපේක්ෂිත ඇප

ඇපදිය නොහැකි වරදක් සිදුකර ඇති බවට හෝ තමන් එවැනි වරදක් සිදු කිරීමට සම්බන් වී ඇතැයි හැඟෙන්නේ නම් තමාව අත්අඩංගුවට ගැනීමට පෙර අධිකරණයට ඉදිරිපත් වී ඇප ගැනීම කලහැක. (1997 අංක 30 දරණ ඇප පනතේ 21 වන වගන්තියෙන් හඳුන්වා ඇත.)

- විමර්ශනය කරන පොලීසියට වාර්තා කිරීම නිසා විදේශගත වීමට නොහැකි වීම,
- තමාගේ පදිංචි ප්‍රදේශයෙන් පිටතට යෑමට නොහැකි වීම,
- සාක්ෂිකරුවන් සිටින ප්‍රදේශවලට ඇතුලත් නොවීම ආදී කොන්දේසි වලට චූදිත බැඳී සිටී.

> "යම්කිසි පුද්ගලයෙකු රක්ෂිත බන්ධනාගාර ගත කරනුයේ වරදට දඬුවමක් ලෙස නොවන බව මතක තබා ගත යුතුය."

## ඇප ලබා නොදෙන අවස්ථා

### පොදු දේපල විනාශ කිරීම

පොදු දේපළේ වටිනාකම රු.25,000.00ට වැඩි යැයි සහකාර පොලිස් අධිකාරිවරයෙකුගේ නිලයකට අඩු නොවන නිලයක නිලධාරියෙකු සහතික කල යුතු අතර යම් අවස්ථාවදී නඩු විභාගය අවසන් වන තෙක් අදාල චූදිතයා රක්ෂිත බන්ධනාගාරගත කල අසාමාන්‍ය අවස්ථාවලදී ඇප ලබාදිය හැකිය.

### එමෙන්ම 1998 අංක 24 දරණ පුරාවස්තු (සංශෝධිත) පනත

මෙම පනත යටතේ චෝදනාවලත් පුද්ගලයෙකු ඇප මත මුදාහැරිය නොහැකි බව සඳහන් වේ. මොවුන්ද සෘජුවම රක්ෂිත බන්ධාගාරගත කරනු ලැබේ.

## සිවිල් ක්‍රියාවලදී

අපරාධමය වැරදි සම්බන්ධයෙන් පමණක් නොව සිවිල් වැරදි සම්බන්ධයෙන්ද ඇප නීතිය බලපානු ඇත.

දිසා අධිකරණය තුල සිවිල් ආරවුල් වාරණ නියෝග, අතුරු තහනම් නියෝග, විධානාත්මක ආඥා නිකුත් කරනු ලැබිය හැකි වන අතර එම ආඥාව ක්‍රියාවේ යෙදවීමට බාධා කරන අයෙකුට අධිකරණයට අපහාස කිරීමේ වරදට අත්අඩංගුවට ගත හැක. එහිදී සිවිල් වරෙන්තුවක් නිකුත් කරමින් යමෙකු අත්අඩංගුවට ගත හැකි අතර එවැනි අයෙකුට නඩුව සම්බන්ධයෙන් කරුණු කියන අවස්ථාව වන තෙක් අත්අඩංගුවේ තබා ගත හැක. එමෙන්ම එවැනි පුද්ගලයන් විසින් අත්අඩංගුවට ගත් නිළධරයන්ට අදාල දිනයෙහි අධිකරණයට ඉදිරිපත් වන බවට සහතික වී බැඳුම්කරයකට අත්සන් කල පසු තාවකාලිකව නිදහස් විය හැක.

ඇප පනත ක්‍රියාත්මක වීමට පෙර අපරාධ නඩු විධාන සංග්‍රහය ක්‍රියාත්මක වී ඇත. එහිදී ඇප දිය හැකි වැරදි සහ ඇප දිය නොහැකි වැරදි ලෙස වැරදි කොටස් 2 කට බෙදා දැක්වා ඇත.

අපරාධ නඩු විධාන සංග්‍රහ පනත 1993 අංක 4 දරණ (සංශෝධන) පනතින් සංශෝධනයට ලක්විය. ඒ අනුව ඇප ලබාදිය හැකි වැරදි සම්බන්ධයෙන් ඇප ලබාදීම ප්‍රතික්ෂේප කිරීමේ අභිමත බලයක් අධිකරණය වෙත පැවරී ඇති බව පැහැදිලිය. අපරාධ නඩු විධාන සංග්‍රහයේ මෙම වගන්ති වලට සමාන වු අදහසක් 1997 අංක 30 දරණ ඇප පනතේ 20 වගන්තිවලට සමාන වු අදහසක් 1997 අංක 30 දරණ ඇප පනතේ 29 වගන්තියෙන් කියැ වේ.

- **ඇප පනතේ 4 වන වගන්තිය** - ඇප දිය හැකි වරදක් සිදුකර ඇති අයෙකුට ඇප දිය හැකි බව
- **ඇප පනතේ 5 වන වගන්තිය** - ඇප දිය නොහැකි වරදක් සම්බන්ධයෙන් සැකකරනු ලබන තැනැත්තෙකු අධිකරණයේ අභිමතය පරිදි මුදා හැරිය හැකි බව.
- **ඇප පනතේ 7 වන වගන්තිය** - ඇප දිය හැකි සහ ඇප දිය නොහැකි වරදක් කරන ලද අයෙකු ඇප මත මුදා හැරීම.
- **ඇප පනතේ 13 වන වගන්තිය** -මරණ දඬුවම හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් හිමිවිය යුතු වරදක් කර ඇති අයෙකුට හෝ සැකකරනු ලබන අයෙකුට මහාධිකරණ විනිශ්චයාකාරවරයෙකුට හැර ඇප මත මුදා හැරිය නොහැක.

## ඇප දීම ප්‍රතික්ෂේප කල හැකි අවස්ථා

මෙම පනතේ 14 වන වගන්තියට අනුව යම් අයෙකුට ඇප දීම ප්‍රතික්ෂේප කර හැකි අවස්ථා 4ක් හඳුන්වා දී ඇත.

- 1. නඩු විභාගයට ඇප මත නිදහස් වූ අය නොපැමිණෙන්නේ යැයි අධිකරණයට සැකයක් මතු වන්නේ නම් ද,
- 2.සැකකරු ඇප ලබාගෙන සිටි විටදී නැවත වරදක් සිදුකර ඇති බවට හැඟේ නම් ද,
- 3.සිදුකර ඇති වරදේ බරපතලකම නිසා මහජන කැළඹීම් ඇතිවෙතැයි සිතේ නම් ද,
- 4.සැක කරුට එරෙහිව ඇති සාක්ෂිකරුවන්ට යම් බලපෑමක් කල හැකියැයි අධිකරණයට හැගේ නම් ද, ඇප ලබාදීම ප්‍රතික්ෂේප කල හැකි වේ.

> “ 1997 අංක 30 දරණ ඇප පනතේ 16 වන වගන්තියට අනුව කිසිම අයෙකු මාස 12කට වැඩි කාලයක් අත්අඩංගුවේ තබා ගත නොහැකි බව දන්වා ඇත. ”

අධිකරණය විසින් සිරදඬුවමක් විදින්නෙකු නොවන අයෙකුට මාස 12කට වඩා රක්ෂිත බන්ධනාගාරයේ තබා ගත යුතු නම් නීතිපතිතුමා මහාධිකරණය වෙත වෙනම ඉල්ලීමක් කර යුතුවේ. එවිට මාස 3 බැගින් එකතුව මාස 12 දක්වා කාලයක් සැකකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ නියෝගයක් මහාධිකරනයට සිදුකල හැක.



## සිද්ධි අධ්‍යයනයක් ඇසුරින්

ඩබ්.ආර්.වික්‍රමසිංහ
එදිරිව, නීතිපති

නඩුවේදී චූදිත මිනිමැරුමක් සම්බන්ධයෙන් 2006.09.28 අත්අඩංගුවට ගෙන ඇත. 2009.03.30 දිනැති ඇප ඉල්ලුම් පත්‍රය මහාධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇත. මෙම චූදිතයා අවුරුදු 3යි මාස 5ක් රිමාන්ඩ් ගත වී සිට ඇත. මෙම නඩුව එම්.එම්.ජයවතී එදිරිව නීතිපති තීන්දුව ප්‍රතිශෝධනය කිරීම පිණිස ගොනුකරන ලද්දකි.

- පෙත්සම් කරුගේ නීතිඥ තර්ක කලේ 1997 අංක 30 දරණ ඇප පනතේ 16 හා 17 වගන්තියට අනුව චූදිතයෙකු මාස 24ක කාලයකට වඩා රිමාන්ඩ් භාරයේ තැබිය නොහැකි බවයි.

- නීතිපති වෙනුවෙන් ඉදිරිපත් කළ තර්කය වුයේ එම්.එම්.ජයවතී එදිරිව නීතිපති **(CA 189/2004)**දරණ නඩුවේ තීන්දුවට අනුව සැකකරුවෙකු මාස 24කට වඩා කාලයක් වුවද රිමාන්ඩ් භාරයේ තැබිය හැකි බවයි. එහිදී බස්නායක විනිසුරු ප්‍රකාශ කළේ ඇප පනතේ 16 හා 17 වගන්ති 14 වගන්තියට යටත්ව කියවිය යුතු බවයි.

මෙහිදී අභියාචනාධිකරණය තීන්දු කලේ

සැකකරුවෙකු රිමාන්ඩ් භාරයේ රඳවා සිටිය හැකි උපරිම කාල සීමාව අවුරුදු 2කි. මෙම අවුරුදු 2ක කාලසීමාව සලකා බලනු ලබන්නේ නීතිපති විසින් ඇප පනතේ 17 වන වගන්තිය යටතේ කටයුතු කර ඇත්නම් පමණි. එසේ 17 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කර නැත්නම් රඳවාගත හැකි උපරිම කාලය අවුරුදු 1කි. මේ අනුව මෙම නඩුවේ සැකකරුට ඇප ලබා දිය යුතු බවට නියම කරන අතර සුදුසු කොන්දේසි වලට යටත්ව ඇප ලබාදිය යුතු බව නියමකර ඇත.

## අභියාචනයක් අතරතුර

එහි 20 (2) වගන්තිය අනුව මහාධිකරණයක් විසින් වරදකරු කිරීමකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ විට අභියාචනාධිකරණය තීරණය කරන තෙක් අභියාචනකට ඇප පිට නිදහස් නොකරනු ලැබූ අයෙකු බන්ධනාගාර ගත කල හැකිය.

එමෙන්ම චූදිතය මරණීය දණ්ඩනය නියම කරනු ලැබූ අවස්ථාවක එම නියෝග ක්‍රියාවේ යෙදීම නතර කොට තීරණය කරනතෙක් රිමාන්ඩ් භාරයේ තැබිය යුතු බව ඇප පනතේ 20 (3) හි දක්වා ඇත.

මිනිමැරුම් (ද.නි.ස 296 වගන්තිය) සොරකම, බලෙන් ලබා ගැනීම, කොල්ලකෑම (ද.නි.ස 366 වගන්තිය) බලෙන් ලබාගැනීම කොල්ලකෑම ස්ත්‍රී දූෂණයට අදාල වැරදි (ද.නි.ස 363 වගන්තිය) වලට වරදකරුවෙකු බවට පත්වූ අයෙකුට අභියාචනාධිකරණයට ඇප ප්‍රතිශෝධන ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති විට ඇප ලබාගන්නා ආකාරය විමසා බලමු.

දණ්ඩ නීතී සංග්‍රහයේ 296 වගන්තියෙන් කියවෙන වැරදි සඳහා

⇩

අධි චෝදනා පත්‍ර භාරදීමට පෙර හෝ පසු / නඩුව ඇරඹීමට පෙර ඇප ඉල්ලා සිටීම

⇩

දණ්ඩ නීති සංග්‍රහයේ 296 වන වගන්තියේ දක්වා ඇති වැරදි සඳහා

⇩

අභියාචනාධිකරණයට ඉල්ලීමක් කල හැක (එය ප්‍රතිශෝධන ඉල්ලුම්පතකි)

⇩

ඒ සඳහා මහාධිකරණයේ ඇප ඉල්ලීම ප්‍රතික්ෂේප කල නියෝග අමුණා තිබිය යුතුය.

එහි අඩංගු විය යුතු කරුණු

- සුවිශේෂි කරුණු මහාධිකරණය විසින් නොසලකා ඇත්ද ?
- චෝදනා ඉදිරිපත් නොකර දිගු කාලයක් රඳවා ඇත්ද ?
- පදනම් රහිත නඩු පවරා ඇත්ද ?
- මහාධිකරණ නියෝගයේ දෝෂයක් පවතීද ?

**අභියාචනයට ඇප දිය හැකිද ? නොහැකි ද? යන්න විමසා බැලීමේදී පහත කරුණු විමසිල්ලට ගනී**

- පෙර වැරදි නැති බව
- වරදේ ස්වාභාවය
- සංවිධානාත්මක කල්ලියක සාමාජිකයෙකුද යන්න
- සාක්ෂිකරුවන්ට බලපෑම් කරයිද නැද්ද යන්න

අධිකරණය සෑහීමකට පත්වන්නේ නම් කොන්දේසි සහිතව හෝ රහිතව ඇප ලබාදීම සිදුකරනු ලබයි.

**ඇප නීතියේ ඇති අණ පනත් අතර වැදගත්යැයි සැලකෙන පනත් කිහිපයක් ඇත.**

1. 1982 අංක 12 දරණ පොදු දේපළ සම්බන්ධයෙන් සිදුකරනු ලබන වැරදි පිළිබඳ පනත
2. පීඩාකාරී ආයුධ පනත
3. 1984 අංක 13 දරණ විෂ වර්ග අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත
4. පුරවැසි ආඥා පනත
5. අල්ලස් පනත
6. 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත
7. පුරවැසි ආඥා පනත
8. අල්ලස් පනත
9. 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධා) පනත
10. බුද්ධිමය දේපළ පනත
11. සත්ව හිංසා කෲරතා ආඥා පනත
12. වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනත

# පොදු දේපළ ආරක්ෂා කිරීමේ පනත

## 1982 අංක 12 දරණ පොදු දේපළ විෂයෙහිලා සිදුකරන වැරදි පිළිබඳ පනත

මෙහිදී පොදු දේපළ සොරකම් කිරීම, දේපළ කොල්ලකෑම, සාපරාධී විශ්වාස කඩකිරීම්, වංචා කිරීම්, ලේඛණ, ව්‍යාජ ලෙස සැකසීම, ගිණුම් වරදවා පෙන්වීම, දැඩි දඬුවම් පැමිණිය හැකි වැරදි වන අතර දේපළ රාජ සන්තක කර සිදුවී ඇති හානි අයකර ගත හැකි වේ.

මෙහිදී ඇප ලබාගැනීම සඳහා අදාල වනුයේ 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය වේ. (පනතේ 3 (2) වගන්තිය ප්‍රකාරව) පොදු දේපළ පනතට අනුව විෂය වස්තුවේ වටිනාකම රුපියල් 25,000ට වැඩිවන අවස්ථාවක නඩු විභාගය අවසන් වන තෙක් අදාල සැකකරුවා රක්ෂිත බන්ධනාගාරගතව තබා ගත හැකිය. පනතේ 8 (2) වගන්තිය අනුව එවැනි විටක බන්ධනාගාරගතකර ඇති සැකකරුව මුදා හැරිය හැක්කේ විශේෂිත අවස්ථාවලදී පමණි.

## පීඩාකාරී ආයුධ පනත

පීඩාකාරී ආයුධ පනත අනුව, පීඩාකාරී ආයුධ ආනයනය කිරීම, නිශ්පාදනය හා ළඟ තබා ගැනීම, විකිණීම, ප්‍රවාහනය ආදිය තහනම් වේ. යම් පුද්ගලයෙකු ළඟ පීඩාකාරී ආයුධයක් ඇති බවට හෝ ඉන් පීඩාවක් සිදුකිරීමට ආසන්න බවට හෝ සැකයක් ඇතිවූ අවස්ථාවක වරෙන්තුවක් නොමැතිව එම සැකකරුව අත්අඩංගුවට ගැනීමට පොලිස් නිලධරයෙකුට බලය ඇති බව මෙම පනතේ 7වන වගන්තියේ දක්වා ඇත. එවැනි පුද්ගලයින්ට සුවිශේෂී තත්වයක් යටතේ මිස මහාධිකරණයෙන් ඇප ලබාගත නොහැකි බව දක්වා ඇත. පනතේ 83 (1) වගන්තිය අනුව එවැනි පුද්ගලයින්ට ඇප ලබාගත නොහැකි බවත් මහාධිකරණයෙන් ඇප ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් දක්වා ඇත.

## 1984 අංක 13 දරණ විෂවර් අබිං අන්තරදායක ඖෂධ (සංශෝධන) පනත

මෙම පනත අනුව හෙරොයින් ග්‍රෑම් 2ක්ද කොකේන් ග්‍රෑම් 2ක්ද මෝෆින් ග්‍රෑම්3ක්ද අබිං ග්‍රෑම් 500ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ළඟ තබාගැනීම, විකිණීම, ආනයනය හා අපනයනය කරන්නා වු පුද්ගලයෙකුට මරණීය දණ්ඩනය හෝ ජීවිතකාලය දක්වා බන්ධනාගාරගත කිරීමක් කල හැකිය. මෙහි 54 (අ) සහ (ආ) වගන්තිවලට අනුව ඉහත කී වරදක් කිරීම සඳහා අනුබලදීමද වරදක් බව දක්වා ඇත. මෙම වරදවල් සඳහාද සැකපිට රක්ෂිත බන්ධනාගාරගත කරන පුද්ගලයන් විසින් විශේෂ අවස්ථාවලදී හැර ඇප ලබා දීම සිදුනොකළ යුතු බව දක්වා ඇත. මෙවැනි අයෙකුට මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඇප ලබාගත නොහැකි බවත් ඔවුන් මහාධිකරණ වෙත ඇප ඉල්ලීමක් කල යුතු බවත් පනතේ 83 (1) වගන්තියෙන් දක්වා ඇත.

## 1948 අංක 31 දරණ ආගමන විගමන පනත

මෙම පනත බොහෝ සංශෝධනයන්ට පාත්‍ර වූ පනතකි. මෙම පනතේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලාංකිකයින් අයථා ක්‍රම මඟින් විදේශගතවීම වැලැක්වීමත්, විදේශිකයින් මෙරටට ඇතුළුවීම පාලනය කිරීමටත් වේ. පසුගිය කාලයෙහි ඉතාලිය වැනි රටවලට අයථා ක්‍රම මඟින් ශ්‍රී ලාංකිකයින් සංක්‍රමණය වන්නට විය. එසේ සංක්‍රමණය වූ අය අත්අඩංගුවට ගැනීම නිසා බන්ධනාගාර පිරෙන්නට විය. මෙම පනතේ 45 වගන්තියට අනුව වරදක් කල අයෙකුට ඇප ලබාදීම පිළිබඳව ප්‍රතිපාදනයක් නොමැත.

## පුරාවස්තු ආඥා පනත

මෙම පනත යටතේ වරදක් කර ඇති අයෙකුට ඇප මත මුදා හැරිය නොහැකි බව (15 වගන්තියෙන්) දක්වා ඇත. මෙහිදී පුරාවස්තුවක් යන්නෙන් කුමක් අදහස්වේද යන්න විමසා බැලීම වැදගත් වේ. නොඑසේනම් ඕනෑම පැරණි දෙයක් ළඟ තබා ගන්නෙකුට කරදරයකට පත්විය හැක. එමනිසා යම් දෙයක් පුරාවස්තුවක්ද නැද්ද යන්නේන් අවසාන තීරණය රඳා පවතින්නේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා විසින් දෙන ලද සහතිකයක් මත වේ.

## අල්ලස් පනත

1954 අංක 11 දරණ අල්ලස් පනත යටතේ චෝදනා ලත් අයෙකු හෝ වරදක් කරන ලදැයි සැක කරන පුද්ගලයෙකුට ඇප ලබාගැනීම සම්බන්ධයෙන් අදාල වන්නේ පනතේ 30A වගන්තිය වේ.

අල්ලස් කොමසාරිස් විසින් බලය පවරනු ලබන ඕනෑම නිලධරයෙකුටම මෙම පනත යටතේ වරදක් යැයි සැකකරන අයෙකුට අත්අඩංගුවට ගැනීමට බලය ඇත. ප්‍රමාදයකින් තොරව මෙවැනි සැකකරුවෙකු මහේස්ත්‍රාත්වරයා ඉදිරියට පැමිණවිය යුතුය. එවිට මහේස්ත්‍රාත්වරයාට අවශ්‍ය නම් ඇප දිය හැකි බව එහි දක්වා ඇත. නමුත් සහතිකයක් වන සැකකරුවෙකු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කල විට ඇප ලබාගත හැකි වන්නේ සුවිශේෂී කරුණු ඉදිරිපත් කිරීමෙන් පමණි.

## සුරාබදු ආඥා පනත


සුරාබදු නිලධරයෙකු විසින් මෙම පනතට අනුව අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු අධිකරණයේ පෙනී සිටින බවට ඇපකරයක් ලබා ගැනීමෙන් පසුව ඇපකරුවන් ඇතිව හෝ නැතිව ඇප මත මුදා හැරීමට හැකි බව මෙම පනතේ 39 වගන්තියෙන් දක්වා ඇත.

## 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත

මෙම පනත අනුව සිවිල් වැරදි සහ අපරාධමය වැරදි හඳුන්වා දී ඇත. සිවිල් වැරදි සම්බන්ධයෙන් වාණිජ මහාධිකරණයේ නඩු පවරා වන්දි අයකරගත හැක. අපරාධමය වැරැද්දක් වන අවස්ථාවක මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකිය. මෙම පනතට අනුව එම වරද සිදුකර අවුරුදු 3ක් හෝ ඒ බව දැනගෙන අවුරුදු 2ක් ගතවීමට ප්‍රථමව නඩු පැවරීම සිදුකල යුතු බව පනතේ 202 වගන්තියෙන් දක්වා ඇත.

## සත්ත්ව හිංසා (කෲරතා) ආඥා පනත

සතෙකුට කෲර ලෙස පහරදීම, කෲර ලෙස සැලකීම, අනිසි ලෙස ප්‍රවාහනය, සතෙකුට වද වේදනා දීම මෙම පනතට අනුව වැරදි ලෙස සැලකේ. මෙම පනත අනුව වැරදි කරන අයෙකුට වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත හැක වේ. සත්ත්ව හිංසා පනතේ 13 වගන්තියට අනුව නඩු විභාගය අවසන් වන තුරු සතුන්ව රඳවා ගැනීමට නිළධරයෙකුට බලය ඇත. මෙම සතුන්ගේ නඩත්තුව සඳහා යන වියදම අදාල සැකකරු වරදකරු වුවහොත් අයකර ගත හැකි වේ.



# බන්ධනාගාරයේ නිත්‍ය නියෝග

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හට අදාල වන දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග, නිළධාරීන්ට රාජකාරිය ඉටු කිරීමේ මග පෙන්වන්නෙකු ලෙස ක්‍රියාකාරන අයුරු දැකගත හැකිය. එහි සඳහන් කරුණු අතර අපරාධ නඩු විධාන සංග්‍රහයේ 289 (2) වගන්තියට වැඩි සැලකිල්ලක් දක්වා ඇති බව පෙනේ.

- ඊට අනුව චෝදනා ලැබුවෙකුට වරදකට දින 14ක කාල සීමාවකට වැඩියෙන් රිමාන්ඩ් භාරයේ තැබීමට කිසිඳු මහේස්ත්‍රාත් අධිකරණයකට නොහැකි වන අතර වඩා දිගු කාලයකට රිමාන්ඩ් භාරයේ තැබීමට හැකි මහේස්ත්‍රාත් අධිකරණ බන්ධනාගාර මුලස්ථාන චක්‍ර ලේඛනයකින් දැනුම් දෙනු ලබයි. එබඳු චෝදනා ලැබුවත් දින 14 කට නොවැඩි කාල සීමාවකට රිමාන්ඩ් භාරයේ තැබීම නිතියානුකූල වේ.

- දින 7කට වඩා අඩු සිර දඬුවමක් සඳහා නියම කරන ලද සිරකරුවකු බන්ධනාගාරයට ගෙන ඇතුළු කරගත නොහැකි බවද මෙම නියෝගවල අන්තර්ගත වේ. ඇප සම්බන්ධයෙන් වන කරුණුද මෙහි අඩංගු වේ.

- ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයා විසින් භාරදෙනු ලබන අපරාධ නඩුවක් පිළිබඳ කිසිම ඇප පෙත්සමක් බන්ධනාගාර අධිකාරී විසින් හෝ ජේලර් විසින් භාර නොගත යුතු බවත්, අත්සන් ලබාගැනීම සඳහා මහේස්ත්‍රාත්වරුන් සහ විනිශ්චයකාරවරුන් භාරයේ එවනු ලබන ඇප පෙත්සම් පමණක් භාරගත යුතු බවත් දන්වා ඇත.

- ඇපකරුට, ඇප මුදල බැදීමට නොහැකි නම් ශ්‍රේෂ්ඨාධිකරනයේ තීන්දුව බන්ධනාගාර අධිකාරීට දන්වන තෙක් එම සිරකරු බරපතල වැඩ නොමැතිව ආරක්‍ෂාව යටතේ තබාගත යුතු බව බන්ධනාගාර නිත්‍ය නියෝග වල දන්වා ඇත.

- මහේස්ත්‍රාත් අධිකරණයේ තමා වරදකරු බවට පත්කොට දින 10ක් ඇතුලත ඇප ගැනීමට තමා තුල ඇති අදහස් හා එසේ ගත්තේ කිනම් හේතු පිටද යන්නේ ජේලර්ට දැන්විය යුතු බව දක්වා ඇත.

- නඩුවක විත්තිකරු සිරභාරයේ සිටීනම් ඔහුට යැවෙන සිතාසි සිවිල් නඩු විධාන සංග්‍රහයේ 68 වන වගන්තියට අනුව සිරගත කොට ඇති බන්ධනාගාරයේ නිලධාරියාට පිස්කල් මගින් භාරදිය යුතු අතර පසුව කාර්යභාර නිලධාරියාගේ අත්සන සහිත සිතාසිය නිකුත් කල අධිකරණයට ආපසු එවිය යුතු වේ.

- තවද සිරකරුවෙකු මුලින්ම ඇතුලත් කරගන්නා බන්ධනාගාරයෙන් නොවන වෙනත් බන්ධනාගාරයකින් සිරකරු මුදාහරින්නේ නම් එසේ මුදා හරිනු ලබන බන්ධනාගාර අධිකාරී මඟින් මුලින් ඇතුලත් කරගත් බන්ධනාගාර අධිකාරීවරයාට ඒ බව දැන්විය යුතු වේ.

- බාලවස්කාර සිරකරුවන් අන් සිරකරුවන්ගෙන් වෙන්කර තැබිය යුතු බව දක්වා ඇති අතර ඔවුන්ගෙන් යමෙකු අවුරුදු 22ට වැඩිවූ විටදී ඒ බව කොමසාරිස්වරයාට දැන්විය යුතුය.

# නීති ආධාර කොමිෂන් සභාව

1978 අංක 27 දරණ පනතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව පිහිටුවා ඇත. එමඟින් නඩු සඳහා නීති ආධාර ලබාදීම සිදු කරනු ලබයි. ඒ අනුව විවිධ මාදිලියේ වැඩ සටහන් දියත් කරමින් මහජනයා දැනුවත් කිරීම් සිදුකිරීමට නීති ආධාර කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත. මෙහිදී වැඩිහිටියන්ට, ළමයින්ට, කාන්තාවන්ට මෙන්ම බන්ධනාගාරගත වී සිටින රැඳවියන්ට ද නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් සිදු කරනු ලබයි.

බන්ධනාගාර රැඳවියන්ට නීති ආධාර කොමිෂන් සභාව වෙත පැමිණීමට නොහැකිවන බැවින් නීතිඥවරුන් ඔවුන් වෙත ගොස් තොරතුරු සහ අදාල ලේඛන සපයා ගෙන ඔවුනට නීති ආධාර ලබා දීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරයි. ලංකාව පුරා බන්ධනාගාර ඇති අතර ඊට සාපේක්ෂව නීති ආධාර කොමිෂන් සභාවේ නීති රීති වලට අනුව යමින් නීති ආධාර කොමිෂන් සභා මධ්‍යස්ථාන මඟින් රැඳවියන්ට ඇප ලබාගැනීම සඳහා මේ වන විටත් කටයුතු සිදුවෙමින් පවතින බව කිව යුතුය.

ඔබගේ පහසුව සඳහා අප නීති ආධාර මධ්‍යස්ථාන දක්වා ඇති අතර ළඟම පිහිටි මධ්‍යස්ථානයට ගොස් ඔබට අවශ්‍ය නීතිමය උපදෙස් ලබාගැනීම කළ හැක.



# LAC මධ්‍යස්ථාන පිහිටි ස්ථාන

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 011-2433618 | මන්නාරම | 023-2222045 |
| අක්කරෙයිපත්තු | 067-2279462 | මාරවිල | 032-2254443 |
| අම්පාර | 063-2223495 | මාතලේ | 066-2224828 |
| අනුරාධපුර | 025-2224465 | මාතර | 041-2233815 |
| අත්තනගල්ල | 033-2297020 | මතුගම | 034-2249262 |
| අවිස්සාවේල්ල | 036-2233857 | මාවනැල්ල | 035-2247272 |
| බද්දේගම | 091-2292051 | මිනුවන්ගොඩ | 011-2297790 |
| බදුල්ල | 055-2225759 | මොණරාගල | 055-2276891 |
| බලංගොඩ | 045-2289099 | ගල්කිස්ස | 011-2718708 |
| බලපිටිය | 091-2255753 | මුලතිවු | 021-2290077 |
| බණ්ඩාරවෙල | 057-2224733 | මුයිතූර් | 026-2238777 |
| බත්තරමුල්ල | 011-2877687 | නාවලපිටිය | 054-2224227 |
| මඩකලපුව | 065-2225399 | මීගමුව | 031-2281080 |
| චාවකච්චේරිය | 021-2270882 | නිකවැරටිය | 037-2260203 |
| හලාවත | 032-2222175 | නුගේගොඩ | 011-2809068 |
| දඹුල්ල | 066-2284551 | නුවරඑළිය | 052-2235260 |
| දෙයියන්දර | 041-2268077 | පානදුර | 038-2244822 |
| දෙනියාය | 041-2271128 | පේදුරුතුඩුව | 021-2260212 |
| ඇඹිලිපිටිය | 047-2230299 | පොල්ගහවෙල | 037-2243039 |
| ගල්ගමුව | 037-2253290 | පොළොන්නරුව | 027-2226572 |
| ගාල්ල | 091-2226124 | පොතුවිල් | 063-2248485 |
| ගම්පහ | 033-2248804 | පුගොඩ | 011-2405333 |
| හම්බන්තොට | 047-2221092 | රත්නපුර | 045-2226899 |
| හැටන් | 051-2222390 | තංගල්ල | 047-2240122 |
| හිඟුරක්ගොඩ | 027-2245521 | තඹුත්තේගම | 025-2276259 |
| හෝමාගම | 011-2748813 | තිස්සමහාරාමය | 047-2239611 |
| හොරණ | 034-2265244 | ත්‍රිකුණාමලය | 026-2226328 |
| යාපනය | 021-2224545 | වාලච්චේනයි | 065-2258349 |
| කඩවත | 011-2922440 | වව්නියාව | 024-2221863 |
| කඩුවෙල | 011-2548150 | වලස්මුල්ල | 047-2245566 |
| කැකිරාව | 025-2263536 | වැල්ලවාය | 055-2274466 |
| කල්මුනේ | 067-2223710 | වරකාපොළ | 037-2277075 |
| කළුතර | 034-2222017 | වාරියපොල | 037-2268199 |
| මහනුවර | 081-2388978 | වැලිමඩ | 057-2244860 |
| කන්තලේ | 026-2234521 | මල්ලකම් | 021-2059170 |
| කැබිතිගොල්ලැව | 025-2298101 | පුත්තලම් | 032-2266636 |
| කෑගල්ල | 035-2231790 | සියඹලාණ්ඩුව | 055-2279250 |
| කිලිනොච්චි | 021-2285618 | දෙහිඅත්තකණ්ඩිය | 027-2250700 |
| කුලියාපිටිය | 037-2284611 | LT-බොරැල්ල | 011-2698003 |
| කුරුණෑගල | 037-2229641 | ගලගෙදර | 081-2061025 |
| මහියංගනය | 055-2258332 | වත්තල | 011-2935907 |
| මාහෝ | 037-2275075 | හෙට්ටිපොල | 037-2291915 |

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**

නො.129, මහාධිකරණ සංකීර්ණය,
හල්ෆ්ට්ස්ඩෝර්ප් වීදිය, කොළඹ 12.

011 2433618

legalaidcommission1978@gmail.com

www.legalaid.gov.lk

